# අධ්‍යාපන අමාත්‍යාංශය
# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## ළගම පාසල හොඳම පාසල ජාතික වැඩ සටහන

## පුරප්පාඩු

පාසල් සංවර්ධනය උදෙසා වන "ළගම පාසල හොඳම පාසල" ජාතික වැඩසටහනේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවත්නා පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා නියමිත සුදුසුකම් ලත් හා පළපුරුදු සහිත අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2019 සහ එහි සංශෝධන පරිදි අවශ්‍ය සුදුසුකම් සහ පලපුරුද්ද, | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පරිදි වැටුප | ඇබෑර්තු සංඛ්‍යාව හා සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණ සහකාර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ එක්වර සිංහල / දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ඕනෑම එක් භාෂාවකට සහ ගණිතය ඇතුළුව විෂයන් හතරක් (04) සඳහා සම්මාන සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම.<br>සහ<br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ විෂයන් තුනකින් (03) (සමාන්‍ය පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) සමත් වී තිබීම.<br>සහ<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක යෙදවුම් ක්ශේත්‍ර යේ පැය 720 කට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම | රාජ්‍ය සේවයේ සමාන තනතුරු සඳහා මූලික වැටුප් පියවර සමග මූලික පියවරෙන් 50% ක් | 01 (ව්‍යාපෘති කළමනාකරන ඒකකය, ඉසුරුපාය - බත්තරමුල්ල) |

**පොදු කොන්දේසි**

01. සියළුම අයදුම්කරුවන් අයදුම්පත් බාරගැනීම අවසන්කරනු ලබන දින වන විට වයස අවුරුදු 30 ට අඩු විය යුතුයි.
02. උක්ත තනතුර සඳහා ස්ප්‍රෙඩ් ෂීට්, වදන් සැකසුම, ඉදිරිපත් කිරීම, අන්තර්ජාලය හා ඊ මේල් සම්බන්ධ පරිගණක සාක්ෂරතාව පිළිබඳ දැනීම අනිවාර්යයෙන් තිබිය යුතුයි.
03. තම මව් භාෂාව හැර ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාවද තිබිය යුතුයි.
04. සේවා කොන්තරාත්තුව මූලික වශයෙන් එක් වසරක් සඳහා වන අතර, ඉන් මාස 06 ක් පරිවාස කාලයකට යටත් වනු ඇත.කොන්ත්‍රාත් කාලය, සතුටුදායක කාර්යසාධනය සහ ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත තවදුරටත් වාර්ෂිකව අළුත් කිරීමේ හැකියාව පවතී.
05. තෝරාගත් සේවකයන්හට ජීවන වියදම් දීමනාව හා සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකත්වයද හිමිය.
06. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාල ආයතන ප්‍රධානී / ප්‍රධාන විධායක නිලධාරී මගින් යොමු කල යුතු අතර , ඔහු විසින් මෙම අයදුම්කරු මෙම පැවරුමට තෝරාගනු ලැබුවහොත් දැනට දරණ තනතුරින් මුදාහැරිය හැකිද යන්න සඳහන්කල යුතුය.
07. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයන්ට කැඳවනු ලැබේ.
08. තමන් විසින්ම සකස් කර ගනු ලබන ජීව දත්ත සහිත අයදුම්පතක්, අධ්‍යාපනික, වෘත්තීය, සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නමද සහිතව ඉදිරිපත් කල යුතුයි.

අයදුම් පත බහා එවනු ලබන කවරයේ වම් ඉහල කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර . "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, 07 වන මහල ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට 2019.09.20 දිනට පෙර ලැබීමට සැළැස්විය යුතුයි.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.